ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය
தேசிய கொள்கைகள், பொருளாதார விவகாரம், மீள்குடியேற்றம் மற்றும் புனர்வாழ்வளிப்பு, வடமாகாண அபிவிருத்தி, தொழிற்பயிற்சி, திறன்கள் அபிவிருத்தி மற்றும் இளைஞர் விவகாரங்கள் அமைச்சு
Ministry of National Policies, Economic Affairs, Resettlement and Rehabilitation, Northern Province Development, Vocational Training & Skills Development and Youth Affairs

"මිලෝදා" පළමු මහළ, බ්‍රිස්ටල් වීදිය, කොළඹ 01. 'மிலோதா', 1ஆம் மாடி,பிரிஸ்டல் வீதி, கொழும்பு 01."Miloda" 1st Floor, Bristol Street, Colombo 01.

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: MNPEA/PLN/PI/2019 | ඔබේ අංකය / உமது இல / Your No: | දිනය / திகதி / Date: 10.01.2019 |

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන්,

<u>රාජ්‍ය ආයෝජන සඳහා සංවර්ධන ව්‍යෘපෘති යෝජනා ඉදිරිපත් කිරීම සඳහා මාර්ගෝපදේශ</u>

අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 18/2222/805/069 සඳහා 2018.10.02 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ලබා දුන් නියෝගය මත ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් රාජ්‍ය ආයෝජන හඳුනා ගැනීමේ වැඩපිළිවෙල තවදුරටත් විධිමත් කිරීම සඳහා චක්‍රලේඛයක් නිකුත් කරනු ඇත.

ඒ අනුව, රාජ්‍ය ආයෝජනවල වියදම් ඵලදායිතාවය සහ ඉතා නිවැරදි ක්‍රියාවලියක් සහතික කිරීම සඳහා මාර්ගෝපදේශ සහිතව නව ව්‍යෘපෘති ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍රය හඳුන්වාදෙන ලදී. රේඛීය අමාත්‍යාංශවල හා පළාත් සභාවල නිලධාරීන්ට ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේ නව ආකෘති පත්‍රය හඳුන්වා දීම සහ එය සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් 2018 වසරේදී ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් වැඩමුළු පෙළක් සංවිධානය කරන ලදී. මෙම නව ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමේ ආකෘතියෙහි නව නිර්ණායක රාශියක් ඇතුළත් කර ඇති අතර ඒවායෙන් සමාජ ආර්ථික සංවර්ධනයට වන දායකත්වය පිළිබිඹු වන අතර, මෙය දැනට පවතින ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කරන ආකෘතියේ වැඩිදියුණු කළ සංස්කරණයයි.

මෙම චක්‍රලේඛය 2019 ජනවාරි 01 දින සිට වලංගු වන බව විශේෂයෙන් සඳහන් කළ යුතු වේ. මෙම නව ආකෘතිය සම්පූර්ණ කිරීමේදී අදාළ ආයතන මුහුණ දෙනු ලබන ගැටළු සහගත තත්වයන් මගහැරවීම සඳහා ඉදිරි මාස 2-3 ඇතුළත පසුවිපරම් කිරීමේ වැඩමුළු පෙළක් ජාතික ක්‍රමසම්පාදන

දුරකථන / தோலைபேசி / Telephone: 011- 4461500
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2322867, 011-2339732
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல / E-mail: info@mnpea.gov.lk
Website: www.mnpea.gov.lk

දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරනු ඇත. එම වැඩමුළු සඳහා අදාළ නිශ්චිත දින ඉදිරියේදී දැනුම් දීමට කටයුතු කරනු ලැබේ.

එමනිසා 2019.01.01 දින සිට රාජ්‍ය ආයෝජන සඳහා ව්‍යාපෘති සකස් කිරීමේදී මෙම නව ආකෘතිය යොදා ගන්නා ලෙස ඔබ අමාත්‍යාංශයේ අදාළ නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන්නේ නම් මැනවි. එමෙන්ම, නව ආකෘතිය යොදා ගැනීමේදී යම්කිසි ගැටළු සහගත තත්වයන් පැහැදිලි කර ගැනීමට අවශ්‍ය නම්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අදාල අංශයේ අධ්‍යක්ෂවරයා සම්බන්ධ කර ගන්නා මෙන් ද වැඩිදුරටත් දන්වනු කැමැත්තෙමි.

මේ සඳහා ඔබගෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

වී.සිවඥානසෝති
ලේකම්

මෙම ලිපියේ මූලාශ්‍රය වන්නේ ලේකම් වරයා අත්සන් කළ ඉංග්‍රීසි පිටපතයි. ඔබේ පහසුව සඳහා මෙය සිංහල භාෂාවට පරිවර්ථනය කර ඇත. මෙම ලිපිය සම්බන්ධයෙන් අවශ්‍ය පැහැදිලි කරගැනීම් සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විමසන්න.
(දුරකථන 0112484612/ 0112484576 හෝ විද්‍යුත් තැපැල: dgnp@npd.treasury.gov.lk )